# ග්‍රාමීය පාසල්වල පහ වසර සිසුන්ගේ භාෂා හැකියා පිළිබඳ විමර්ශනාත්මක අධ්‍යයනයක් (රත්නපුර දිස්ත්‍රික්කයේ ග්‍රාමීය පාසල් ඇසුරින්)

එම්. එල්. සීතා ජයවර්ධන

B.Ed., M.Ed.

මෙම පර්යේෂණ නිබන්ධනය
කොළඹ විශ්වවිද්‍යාලයේ අධ්‍යාපන දර්ශනපති උපාධිය සඳහා
ඉදිරිපත් කරනු ලබන්නකි.

අධ්‍යාපන පීඨය, කොළඹ විශ්වවිද්‍යාලය.

1998.

UCLIB
480858

University of Colombo Library Sri Lanka

## සංක්ෂිප්තය

ප්‍රාථමික අධ්‍යාපනය ලැබීම ලොව යහපත් පුරවැසියකු වීම සඳහා අවම අවශ්‍යතාව බවට පත් වී ඇති අතර, 5 ශ්‍රේණිය දක්වා අධ්‍යාපනය ලැබීමෙන් පමණක් අවම භාෂා හැකියා ලබා ගන්නා බවද, අද්‍යතනයේ පිළිගෙන තිබේ. "සැමට අධ්‍යාපනය " නම් වූ යුනෙස්කෝ වැඩ සටහන් මගින් ප්‍රාථමික අධ්‍යාපනය ලෝපුර-වැසියන්ට අත්‍යවශ්‍ය අංගයක් ලෙස හඳුන්වනු ලැබේ. මානව ශිෂ්ටාචාරයේ සංවර්ධනය සඳහා ප්‍රධාන සාධකය භාෂාව වෙයි. භාෂා කුසලතා නිසිලෙස නොලැබීම හේතුවෙන් පුද්ගලයකුගේ අධ්‍යාපනික කටයුතු අසර්ථක වන බවද, දෙමාපියන්ගේ සමාජ ආර්ථික හා රැකියා මට්ටම් මේ සඳහා බලපාන බව ද අද අනාවරණය වී තිබේ.

ග්‍රාමීය භාවය හා නොදියුණු භාවය නිසා සිසුන්ගේ භාෂා කුසලතාව වෙනස් වෙයි. ඉගෙනීම මිනිස් අයිතියක් ලෙසත් ප්‍රකාශයට පත් කර ඇති අතර ප්‍රාථමික අධ්‍යාපනය කෙරෙහි 1970 දශකයෙන් පසු ලොව පුරා දැඩි අවධානයක් යොමු වී තිබේ. ජාතික අධ්‍යාපන කොමිෂන් සභා වාර්තාව මගින් ද භාෂා නිපුණතාව අත්‍යවශ්‍ය සාධකයක් ලෙස හඳුන්වා ඇත. 1980 වන විට ප්‍රාථමික අධ්‍යපනයෙහි විවිධ ප්‍රවීණතා සංවර්ධනය කිරීමට බොහෝ රටවල් උනන්දු වී තිබේ.

University of Colombo
Library

මේ ප්‍රවීණතා මගින් චාතුර්විධ භාෂා කුසලතා සංවර්ධනය කිරීමට අපේක්ෂා කෙරෙයි.

ශ්‍රී ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය නිම කළ සිසුන්ගෙන් භාෂා කුසලතා ලබා ඇත්තේ 21% ක් පමණක් බවත්, ශ්‍රී ලංකාවේ සාක්ෂරතාවය 64.8% ක් බවත් හෙළිවීමෙන් අප රටෙහි භාෂා සාධන මට්ටමෙහි අපේක්ෂිත නිෂ්ඨාවන් කරා ළඟා වී නැති බවත්, විද්‍යමාන වෙයි. එහෙත් ලංකාවේ ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ පර්යේෂණ ප්‍රමාණවත් ලෙස සිදු වී නැත. කෙසේ වතුදු භාෂාව පිළිබඳ පර්යේෂණ නව මඟකට යොමු වූයේ 1950 දශකයේ පමණ සිටය. එමගින් පාසල හා නිවස ද භාෂාව කෙරෙහි බලපාන බව පිළිබඳව අවධානය යොමු විය. ඉගෙනුම් කටයුතු කෙරෙහි භාෂාව බලපාන අතර ළමුන් අයත් සමාජ ආර්ථික තත්වය භාෂාව කෙරෙහි බලපාන බවත්, වියරණ පිළිබඳ සාධන තත්වය පහළ මට්ටමක පවතින බවත්, මේ සඳහා ගුරුවරුන්ගේ දැනුම් මට්ටම් බල පා ඇති බවත්, හෙළි වී තිබේ. මේ හැර ශ්‍රී ලංකාවේ ග්‍රාමීය ප්‍රදේශවල භාෂා හැකියා සංවර්ධනය වී නැති බවත්, බහු ශ්‍රේණි පාසල්වල භාෂා හා ගණිත මට්ටම් අතිශයින්ම පහළ මට්ටමක පවතින බවත් අනාවරණය වී ඇත.

මෙම අධ්‍යයනය මගින් ගද්‍ය කොටස් වටහා ගැනීම කථා කිරීමේ හැකියාව විමසීම, චරිතාරෝපිත කථා ඉදිරිපත් කිරීම, කවි තාලයට ගායනය, විරාම ලකුණු භාවිතය, විමසා බැලීම, ආදිය

අරමුණු කර ගන්නා ලදි. මෙහි නියැදිය සඳහා පාසල් හයක් හා 5 වසර සිසු නියැදිය වශයෙන් සිසුන් 200 ක් ද යොදා ගන්නා ලදි. දත්ත රැස්කිරීම සඳහා සාධන පරීක්ෂණ යොදා ගැනීමට සිදු විය.

කවි කියවා තේරුම් ගෙන පැහැදිලිව හඬින් ලියූ සිසුන් සංඛ්‍යාව ඉතා පහළ මට්ටමක පවතී. රචනයක් ලිවීමේ කුසලතාවය 5 වසර සිසුන් තුළ නිසි පරිදි සාධනය වී නැත. ග්‍රාමීය පාසල්වල සිසුන්ගේ වැඩිම සංඛ්‍යාවකට 5 වසරේ දී අපේක්ෂිත චරිතාරෝපිතව කථා කිරීමට නොහැකිය. ප්‍රසන්න හඬපාලනයකින් කියවීමට ද 5 වසර ග්‍රාමීය පාසල්වල සිසුන්ගේ වැඩිම සංඛ්‍යාවකට නොහැකි වී ඇති අතර ශබ්දනඟා කියවීමට මෙම සිසුන්ගේ හැකියාව ඇත්තේ ඉතා සුළු පිරිසකට පමණි. මාතෘකාවකට අනුව කථා කිරීමේ කුසලතාව ලබා ඇත්තේ ද ඉතා අඩු ප්‍රතිශතයක් වන අතර, විරාම ලකුණු නිසිලෙස භාවිතා කිරීමේ හැකියාව ඇත්තේ ද ඉතාම සුළු පිරිසකට පමණි. කවි ගායනා කිරීමට මෙම සිසුන්ගෙන් හැකියාව ඇත්තේ ද 1/4 කටත් අඩු සංඛ්‍යාවකට පමණි. කෙටි කාලයක දී ඡේදයක් කියවීමට හැකි 5 වසර ග්‍රාමීය සිසුන් ප්‍රමාණය ඉතා විරල වන අතර සවන් දී ප්‍රශ්න වලට පිළිතුරු දීමට හැකියාව ඇත්තේ ද ඉතාම සුළු පිරිසකට පමණි. මේ අනුව පැහැදිලි වන්නේ, ග්‍රාමීය පාසල්වල 5 වසර සිසුන්ගේ භාෂා කුසලතා අපේක්ෂිත අයුරින් ඉටු වී නොමැති බවයි.

මෙම ගැටළු නිරාකරණය කර ගැනීම සඳහා භාෂාව ඉගැන්වීම පිළිබඳව පර්යේෂණ යොදා ගත යුතුව ඇත. භාෂාව ඉගැන්වීමේ නව ක්‍රම ද අවශ්‍ය වෙයි. ග්‍රාමීය පාසල් සඳහා සම්පත් ලබාදීමේ දී ප්‍රමුඛතාව දිය යුතුය. සන්නිවේදන මාධ්‍ය පහසුකම් ග්‍රාමීය පාසල් සඳහා ලබාදිය යුතුය. නව තාක්ෂණය හඳුන්වා දිය යුතු අතර, අමතර පොත් පත් ග්‍රාමීය පාසල් සඳහා ලබාදීම අත්‍යවශ්‍ය වෙයි. දෙමාපියන් දැනුවත් කිරීම හා ගුරු පුහුණුව වඩාත් අර්ථවත් හා ඵලදායි ලෙස සිදු කළ යුතු අතර, ග්‍රාමීය දෙමාපියන්ගේ සමාජ ආර්ථික තත්වයන් සංවර්ධනය කළ යුතුව තිබේ. මෙම පාසල්වල කළමනාකරණ කටයුතු අධීක්ෂණ කටයුතු මෙන්ම, ග්‍රාමීය ප්‍රජාව පිළිබඳව ද වැඩිදුරටත් අධ්‍යයනය කළ හැකිය.